# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනයද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. ස්ථානභාර නිලධාරී - රාජ්‍ය ඔසුසල (JM 1.1) II ශ්‍රේණිය - පුරප්පාඩු 03**

**සුදුසුකම්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඖෂධවේදය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**හෝ**

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන උපාධියක් ලබා තිබීම

**සහ**

(ඇ) පරිගණක සාක්ෂරතාවය

**සහ**

(ඈ) රජයේ/ රාජ්‍ය සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ඖෂධවේදියකු ලෙස අවම වශයෙන් වසර 01 ක පශ්චාත් සේවා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : රු. 53,250/-, 945/- X 10, 1,420 /- X 18 - 88,260/-
(දළ මාසික වේතනය රු. 145,842/- ක් පමණ වනු ඇත)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලනොපායි.)

සැ.යු : ලිඛිත පරීක්ෂණයක් පවත්වා නියමිත ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබනු ඇත.

**2. කළමනාකරණ සහකාර (ඖෂධවේදී) (MA 2.1) III වන ශ්‍රේණිය - පුරප්පාඩු 08**

**වෘත්තීය සුදුසුකම්**

(අ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද ඖෂධවේදියකු ලෙස වූ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ලියාපදිංචි සහතිකය සමග, රජයේ/ සංස්ථාවක/ මණ්ඩලයක/ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයකට අයත් ලියාපදිංචි ඔසුහලක ඖෂධ සංයෝජක කාර්යයන්හි අවම වශයෙන් වසර එකක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**සහ**

(ආ) පරිගණක සාක්ෂරතාවය

**වැටුප් පරිමාණය** : රු. 37,890/- 375/- X 10, 440 /- X 7, 620/- X 4, 825/- X 20 - 63,700/- (දළ මාසික වේතනය රු. 115,914/- ක් පමණ වේ)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

**3. කළමනාකරණ සහකාර (මුදල් භාරකරු) (MA 1.1) III වන ශ්‍රේණිය - පුරප්පාඩු 06**

**සුදුසුකම්**

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන්, දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය/ වාණිජ අංක ගණිතය හා තවත් එක් විෂයයක් ඇතුළත්ව විෂයයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්ව සිටිය යුතුය.

**සහ**

(ආ) I. අ.පො.ස (උ/පෙළ) (නව විෂය නිර්දේශය) විභාගයෙන්, (පොදු ප්‍රශ්න පත්‍රය හැර) වාණිජ අංශයෙන් අවම වශයෙන් විෂයයන් 02 කින් සමත්ව සිටිය යුතුය.

**හෝ**

II. අ.පො.ස (උ/පෙළ) (පැරණි විෂය නිර්දේශය) විභාගයෙන්, වාණිජ අංශයෙන් විෂයයන් 03 ක් සමත්ව සිටිය යුතුය.

**සහ**

(ඇ) පරිගණක සාක්ෂරතාවය

**සහ**

(ඈ) රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අයකැමිවරයෙකු ලෙස, අවම වශයෙන් වසර 03 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : රු. 34,890/- 375 /- X 10,440/- X 7, 620/- X 4,825/- X 20 - 60,700/- (දළ වශයෙන් මාසික වේතනය රු. 110,458/- ක් පමණ වනු ඇත)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

**ආයතනික ප්‍රතිලාභ :**

තෝරාගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සමාජයීය ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයා හා පවුලේ අය සඳහා රෝහල්ගතවීමේ වෛද්‍ය රක්ෂණාවරණය ඇතුළු ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත සමග අයදුම්පතෙහි වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. සියලුම අයදුම්පත් 2025.04.28 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන),**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**"මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41,**
**කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**දුරකථන අංකය 0112 320 356 -9**